# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/06/03/04/2022(18) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.02. 17 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු 2022

දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී/ වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු/ කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිරත නිලධාරීන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු සඳහා මා විසින් නිකුත් කරන ලද 2021.12.01 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 03/2021 හා බැඳේ.

02. එකී චක්‍රලේඛයේ 6.12 වගන්තිය ප්‍රකාරව යම් සේවා ස්ථානයක සේවය කරන 2022 මැයි 31 දිනට වයස අවු. 57 ඉක්මවූ නිලධරයන් ද, ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරන 2022 මැයි 31 දිනට වයස අවු. 59 ඉක්ම වූ නිලධරයන් ද ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි ස්ථාන මාරු නොකළ යුතු වුවද, 2022.01.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2022 මගින් රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම මත ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 03/2021 හි 6.12 වගන්තිය නොසලකා හැර එනම්, **වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් වන සියළු නිලධාරීන්ගේ වයස නොසලකා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.**

03. ඒ අනුව, ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතනවල නිලධාරීන් වෙත ද මේ සම්බන්ධයෙන් නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

මෙයට,
ඔබගේ සේවයට කැපවූ,

**ආර්.සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"